The Journal of the Faculty of Humanities (JHU) (2025), Volume 33, Issue 1, 159-186
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# සීගිරි පද්‍යවල අන්තර්ගත ත්‍රෛකාලික ක්‍රියාපද පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

ඉන්දික මුණවීර

## Abstract

The Sigiri graffiti constitute a significant and enduring corpus within the Sinhala literary and linguistic tradition. These inscriptions, etched by numerous anonymous visitors to the rock fortress of Sigiriya between the 8th and 10th centuries AD, represent some of the earliest surviving examples of Sinhala poetry and offer invaluable insights into the linguistic and cultural landscape of medieval Sri Lanka. Notably, they preserve a range of linguistic features that are critical for understanding the historical development of the Sinhala language. This study focuses specifically on the morphological structures of verbs as they appear in the Sigiri graffiti, with particular attention to their formation in the past, present, and future tenses. The principal research question addresses the structural formation of these three tense categories within the graffiti. Employing a qualitative research methodology, the study utilises *Sigiri Graffiti*, compiled by Professor Senarath Paranavithana, as a key secondary source. While various scholars have conducted research on Sigiriya, Sigiri graffiti, and verbs in contemporary literature, this study aims to fill a gap by providing a focused linguistic analysis of verb usage in the Sigiri graffiti. Through

detailed linguistic analysis, the research identifies recurring morphological patterns and explores both the standard forms and the unique, context-dependent variations evident in the verbal constructions. The findings illuminate the complex interplay between established grammatical norms and the creative linguistic expressions of the time, thereby contributing to a deeper understanding of historical Sinhala verb morphology. The study concludes that the tense structures observed in the Sigiri graffiti exemplify a convergence of traditional linguistic usage and innovations shaped by the specific communicative and poetic purposes of the inscriptions.

**Keywords**: *Sigiri Graffiti, Verbs, Past tense, Present tense, Future tense, Verb structure*

## හැඳින්වීම

ක්‍රි.ව. 7 සහ 8 සියවස් කාලය තුළ ආරම්භ වී ක්‍රි.ව. 13 වන සියවසෙහි මැද භාගය දක්වා වූ කාලය සිංහලයේ මධ්‍යතන යුගය වශයෙන් සැලකෙයි. සිංහල භාෂාවේ පරිණාමය සම්බන්ධයෙන් ගත් කල පරිණාමීය ලක්ෂණ රැසකින් යුක්ත කාල වකවානුවක් ලෙස මෙම අවධිය නම්කළ හැකිය. මෙම අවධිය සිංහල භාෂා විෂයෙහි වැදගත් වනුයේ ප්‍රාකෘත භාෂා ලක්ෂණවලින් ඉවත් වෙමින් සිංහල භාෂාවට විශේෂ ලක්ෂණ රැසක් එකතු වූ සංක්‍රමණික අවස්ථාවක් ලෙසය. (පේමානන්ද හිමි, 2004) මෙම අවධියෙහි භාෂා ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ඉතා වැදගත් මූලාශ්‍රයක් ලෙස සීගිරි පද්‍ය දැක්විය හැකිය. මෙම අධ්‍යයනයේ දී සිදු කෙරෙනුයේ සීගිරි පද්‍යවල සඳහන් ත්‍රෛකාලික ක්‍රියා පද පිළිබඳ අධ්‍යයනයක යෙදීමයි. ඒ අනුව මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ පසුබිම ලුහුඬින් පහත පරිදි දැක්විය හැකිය.

ශ්‍රී ලංකාවේ ක්‍රි.ව. 8, 9, 10, යන ශතවර්ෂවලට අයත් සිංහල භාෂාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී සීගිරි කැටපත් පවුරේ ලියා ඇති සීගිරි පද්‍ය ඉතා වැදගත් තැනක් ගනී. එනම් මෙම යුගවලදී සිහගිරි පර්වතයට නැගුණු ඇතැම් රසාඥයෝ එහි බිත්තියෙහි සිත්තම් වී ඇති කතුන් හා අවට පරිසරය බලා තම මනෝභාවයෙහි පහළ වූ

අදහස් පද්‍යයට නගමින් එහි ලියා ආහ. මෙසේ සිංහල බසින් රචිත පද්‍ය 685ක් පමණ හඳුනාගෙන තිබේ. (මුදියන්සේ, 2004) මෙම පද්‍ය දෙස අවධානය යොමු කිරීමේ දී ඒවායෙහි භාෂා ශෛලිය, වාක්කෝෂය හා ව්‍යාකරණ ලක්ෂණ අතින් ඉතා වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කොටගෙන තිබේ. විශේෂයෙන් මෙම සීගිරි පද්‍ය එම යුගවල දී ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සිට එය නැරඹීම සඳහා පැමිණි පුද්ගලයන් විසින් රචනා කොට තිබීම ද ඉතා සුවිශේෂ කාරණයකි. එනම්, එම යුගවල දී විවිධ ප්‍රදේශවල භාවිත වූ ව්‍යවහාරිත සිංහල භාෂාවේ ස්වරූපය මැනවින් ප්‍රකට වන, වර්තමානය වන විටත් එම භාෂා ලක්ෂණ එලෙසින්ම ශේෂව පවතින අංගයක් ලෙස සීගිරි පද්‍ය දැක්විය හැකිය. මෙම සීගිරි පද්‍ය තුළ අන්තර්ගත භාෂාව මඟින් එවකට පැවති ජන සාහිත්‍ය, ජන විඥානය හා ජන සමාජය යනාදිය අධ්‍යයනය කිරීමෙහිලා ද අතිශයින් වැදගත් සාහිත්‍ය මූලාශ්‍රයක් ලෙස ද පෙන්වාදිය හැකිය. මන්දයත්, මේ පද්‍ය තුළ බහුල වශයෙන් අන්තර්ගත වනුයේ සම්භාව්‍ය සිංහල භාෂා ශෛලිය නොව එවකට සමාජයේ එදිනෙදා කථාබහ සඳහා භාවිත කළ සාමාන්‍ය සිංහල ව්‍යවහාරය බව බොහෝ විද්වතුන්ගේ අදහසයි. එකල සිංහල භාෂාවේ ව්‍යවහාර වූ නාමපද, ක්‍රියාපද, නිපාත පද, යනාදි සුවිශද භාෂාත්මක ලක්ෂණ රාශියක් මෙම පද්‍ය තුළ ගැබ්ව පැවතීම විශේෂත්වයක් ලෙස දැක්විය හැකිය. මෙම පද්‍ය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී වාග්විද්‍යාත්මක විමර්ශනයක් සඳහා අවැසි තොරතුරු අන්තර්ගත වීම ද මෙහි ඇති විශේෂත්වයක් ලෙස දැක්විය හැකිය. ඒ අතර පූර්වෝක්ත යුගවල දී සිංහල භාෂාවේ ක්‍රියාපදයේ භාවිතය පිළිබඳ වාග්විද්‍යාත්මක ව බොහෝ තොරතුරු විමර්ශනය කරගත හැකිය. මෙම පර්යේෂණයේ දී සීගිරි ගීවල සඳහන් ත්‍රෛකාලික ක්‍රියාපදවල සංස්ථිතිය පිළිබඳ අධ්‍යයනය කරනු ලැබේ. සීගිරි පද්‍යවල සඳහන් ත්‍රෛකාලික ක්‍රියාපදවල සංස්ථිතිය කෙබඳු ද? යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ගැටලුවයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ සිදු කරන ලදි. මෙහිලා මතු සඳහන් ගැටලුවට පිළිතුරු සෙවීම් සඳහා දත්ත රැස්කිරීම උදෙසා ද්විතීයික මූලාශ්‍රය භාවිත කළ අතර මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරින්ගේ සීගිරි ග්‍රැෆිටි කෘතිය ඒ

සඳහා පරිශීලනය කරන ලදි. මීට අමතරව සිංහල භාෂා ව්‍යාකරණය සම්බන්ධයෙන් ලියැවී ඇති ව්‍යාකරණ විවරණ කෘති, වාග්විද්‍යාත්මක කෘති යනාදිය න්‍යායාත්මක දැනුම සඳහා පරිශීලනය කරන ලදි.

මෙම අධ්‍යයනයෙහි මුල්ම පියවර වශයෙන් මෙහි දී සිදු කරන ලද්දේ සීගිරි ග්‍රැෆිටි දෙවැනි වෙළුමෙහි අන්තර්ගත සීගිරි පද්‍යය කියවා ඒවායෙහි ක්‍රියාපද ඇතුළත් දත්ත සංහිතාවක් සකස් කිරීමයි. එහිලා එක්සෙල් ශීට් භාවිත කරමින් සීගිරි පද්‍ය අංකය, සීගිරි පද්‍ය අයත් සියවස, සීගිරි පද්‍ය අන්වය, අර්ථය, අදාළ ක්‍රියා පද, එම ක්‍රියාපදවලට අයත් ව්‍යාකරණ ප්‍රවර්ගය, යනාදි වශයෙන් වගුගතකොට දැක්වීමයි. ඉන් අනතුරුව එම දත්ත සංහිතාව තුළින් අතීත, වර්තමාන හා අනාගත යන කාල තුනට අයත් ත්‍රෛකාලික ක්‍රියාපද හඳුනාගන්නා ලදි. එම ක්‍රියාපද අතීත, වර්තමාන හා අනාගත වශයෙන් වරනැගී ඇති අකාරය ක්‍රියා රූප කිහිපයක් ආශ්‍රයෙන් වෙනම සටහන් කර ගැනීම සිදු විය. පසුව එම ක්‍රියාපද කාල තුනට අයත් වන පරිදි වරනැගෙන ආකාරය දක්වමින් ඒවායේ ප්‍රත්‍යය ආදි විශේෂ ලක්ෂණ විමර්ශනයට ලක් කරමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි. අනතුරුව එම දත්ත විශ්ලේෂණය හරහා හඳුනාගත් ලක්ෂණ අනුසාරයෙන් ඒ පිළිබඳ සාකච්ඡාවත් සිදු කරන ලදි.

## සාහිත්‍ය විමර්ශනය

සිදත් සඟරා කතුවරයා ත්‍රෛකාලික ක්‍රියාව යන්න පහත පරිදි දක්වා තිබේ.

අන් ත ම සදන් බඳ කිරිය දනු තෙ කලේහි
නිමියේ අයු නොනිමියේ වත්මන් නොපැටියේ අනා

(සෝමාලෝකතිස්ස හිමි, 2014)

සිදත් කතුවරයා ත්‍රෛකාලික ක්‍රියාව තෙකල් කිරිය යනුවෙන් දක්වා ඇත. එනම් කාල තුනක් දක්වා තිබේ. අතීත කාලය (නිමියේ අයු), වර්තමාන කාලය (නොනිමියේ වත්මන්) හා අනාගත කාල (නොපැටියේ අනා) යනු එම වර්ග කිරීමයි. (සෝමාලෝකතිස්ස හිමි, 2014)

එමෙන්ම සිදත් සඟරාවේ ත්‍රෛකාලික ක්‍රියා වරනැඟීමෙහිලා උපයෝගී වන පුරුෂත්‍රයක් දක්වා ඇත. අන් ත ම සදන් බඳ කිරිය යනුවෙන් දක්වා තිබේ. එනම් අන්‍ය කාරක, ත ශබ්ද කාරක, ම ශබ්ද කාරක යයි සිංහල භාෂාවේ පුරුෂ තුන දක්වා ඇත. පාලි හා සංස්කෘත භාෂාවල එන ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ හා උත්තම පුරුෂ යන හැඳින්වීමට වඩා සිදත් සඟරා ගත් කරු ශාස්ත්‍රීය ආකාරයෙන් මෙම පුරුෂ භේදය දක්වා තිබීම ප්‍රශස්ථය. සිදත් සඟරාවෙහි දක්වනුයේ ක්‍රියාව සිදු කොට නිමාවට පත් වී ඇත්නම් එය අතීත ක්‍රියාවකි. ඉකුත්ව ගිය ක්‍රියාවකි. පටන් ගෙන නිමාවට පත් නොවූ ක්‍රියාව වර්තමානයයි. පවතින ක්‍රියාවයි. ආරම්භ නොකළ ක්‍රියාව අනාගතයයි. නොපැමිණි ක්‍රියාවයි. මේ අයුරින් ක්‍රියාවට පුරුෂ තුනක් සහ කාල තුනක් ද ඒකවචන හා බහුවචන වශයෙන් වචන දෙකක් ද කර්තෘ කාරක, කර්ම කාරක හා භාව කාරක වශයෙන් කාරක තුනක් ද දක්වා ඇත (සෝමාලෝකතිස්ස හිමි, 2014).

## කාලත්‍රයේ ප්‍රථම පුරුෂ ඒකවචන ප්‍රත්‍යය

| අතීත කාලය | වර්තමාන කාලය | අනාගත කාලය |
|---|---|---|
| ඉ - තිටි (සතුටු වීමෙහි) | ඔ - බෝ (බීමෙහි) | අන්නේ - දනන්නේ (දන් දීමෙහි) |
| ඊ - වැනහී (වැනසීමෙහි) | ඒ - දෙනෙ (දිනීමෙහි) | එන්නේ - දෙන්නේ (දීමෙහි) |
| උ - කුමටු (කිමිදීමෙහි) | ඉ - පවති (පැවතීමෙහි) | ඔන්නේ - බොන්නේ (බීමෙහි) |
| ඒ - කෙළේ (කිරීමෙහි) | ආ - පුදා (පිදීමෙහි) | නේ - වස්නේ (වැසි වැසීමෙහි) |

(සෝමාලෝකතිස්ස හිමි, 2014)

## කාලත්‍රයේ ප්‍රථම පුරුෂ බහුවචන ප්‍රත්‍යය

| අතීත කාලය | වර්තමාන කාලය | අනාගත කාලය |
|---|---|---|
| උං - ගෙතූ (ලිවීමෙහි) | අත් - වනත් (වර්ණනා කිරීමෙහි) | අන්නෝ - පුදන්නෝ |
| ඔ - කළෝ (කිරීමෙහි) | ඉත් - විඳිත් (විඳීමෙහි) | අන්නාහු - වන්නාහු |
| උ - උගත්හු (ඉගෙනීමෙහි) | එත් - දෙත් (දීමෙහි) | නාහු - නොදක්නාහු |
| උන් - බුන් (බිඳීමෙහි) | ඔත් - බොත් (බීමෙහි) | නේ - නොදක්නේ |

(සෝමාලෝකතිස්ස හිමි, 2014)

කාලත්‍රයේ මධ්‍යම පුරුෂ ඒකවචනය සඳහා /හි/ ප්‍රත්‍යයත් බහුවචනය සඳහා /හු/ ප්‍රත්‍යය ද යෙදෙන අතර උත්තම පුරුෂ ඒකවචනය සඳහා /ම්/, /මි/ ප්‍රත්‍යයන් හා බහුවචනය සඳහා /මු/, /මෝ/, /මිහ/, /මිහු/ යන ප්‍රත්‍යයන් දක්වා තිබේ (සෝමාලෝකතිස්ස හිමි, 2014).

ඒ අනුව පාලි ව්‍යාකරණයෙහි ආඛ්‍යාත හෙවත් ක්‍රියාපද යන්න පහත පරිද්දෙන් දක්වා ඇත.

යං තිකාලං තිපුරිසං ක්‍රියාවාචී තිකාරකං
අත්ථිලිංගං ද්විවචනං තදාඛ්‍යාතන්ති වුච්චති

(ධම්මරතන හිමි, 2014)

පාලි බාලාවතාරයෙහි ඉහත සූත්‍ර - වෘත්තියට අනුව ක්‍රියාවල තිබිය යුතු ලක්ෂණ -

| කාල භේදය | පුරුෂ භේදය | වචන භේදය | කාරක භේදය |
|---|---|---|---|
| අතීත | ප්‍රථම පුරුෂ | ඒකවචන | කර්තෘ කාරක |
| වර්තමාන | මධ්‍යම පුරුෂ | බහුවචන | කර්ම කාරක |
| අනාගත | උත්තම පුරුෂ | | භාව කාරක |

මෙම බාලාවතාර ව්‍යාකරණයේ ඉහත පැහැදිලි කිරීමට අනුව ක්‍රියාපදයක් වරනැගීමේ කාල තුනක් පවතින බවත් ඒවා පුරුෂ/වචන හා කාරක භේදය අනුව වරනැගෙන බවත්, ලිංග භේදයක් දැකිය නොහැකි බවත් හඳුනාගත හැකිය.

නමුත් සිංහල භාෂාවේ ව්‍යාකරණය කෘතියෙහි තෙකල් කිරිය ප්‍රභේද දෙකක් ඔස්සේ දක්වා ඇත. එනම් අතීත හා අනතීත භේදයයි. මෙහි අනතීත භේදය වර්තමාන හා අනාගත යනුවෙන් ප්‍රභේද දෙකක් යටතේ දක්වා ඇත. ව්‍යවහාර සිංහලයෙහි කාල භේදය සඳහා ක්‍රියා ධාතු වරනැගීමේ දී පුරුෂ, වචන භේදයක් දක්නා නොලැබීමත්, විශේෂ අනාගත ක්‍රියා රූපයක් නොතිබීමත් එම වෙනසට හේතුව බව දක්වා ඇත (කරුණාතිලක, 2022).

පූර්වෝක්ත මාතෘකාවෙහි සාකච්ඡාවට බඳුන්වන ත්‍රෛකාලික ක්‍රියා යනුවෙන් හැඳින්වෙනුයේ අතීත, වර්තමාන හා අනාගත යන කාල තුනෙහි වරනැගෙන ක්‍රියාපදයි. මේවා යෙදෙන්නේ වාක්‍යයක අවසානයෙහි පමණි. තවත් අයුරකින් සඳහන් කරන්නේ නම් ත්‍රෛකාලික ක්‍රියා ගණයට අයත් වනුයේ සිංහල භාෂාවෙහි එන ශුද්ධ ක්‍රියා/ ශුද්ධ ආඛ්‍යාත පමණකි. මේවා උක්ත කර්තෘගේ ලිංග භේදය අනුව වෙනස් වන්නේ නැත. එසේ වෙනස් වනවා නම් වෙනස් වනුයේ කෘදන්ත ක්‍රියා පමණි.

උදා: මිනිසා ගොයම් කපයි/ කපන්නේ ය.
ගැහැනිය ගොයම් කපයි/ කපන්නී ය.

ඉහත වාක්‍යය දෙකෙහි කපයි යන ක්‍රියා පදය ශුද්ධ ක්‍රියා පදයක් ලෙසත්, කපන්නේ ය / කපන්නී ය යන ක්‍රියාපද කෘදන්ත ක්‍රියාපද වේ. ත්‍රෛකාලික ක්‍රියා යනුවෙන් අදහස් කරනු ලබන්නේ තුන් කාලයටම අදාළව සකසා ගත හැකි ශුද්ධ ක්‍රියා වුව ද, නූතන ව්‍යවහාරය දෙස බලන කල එබඳු ක්‍රියා දක්නට ඇත්තේ අනතීත/ වර්තමාන කාලය සඳහා පමණි. අතීතය හා අනාගතය සඳහා යෙදෙන්නේ කෘදන්ත ක්‍රියායි.

**කර ධාතුව**

| වර්තමාන | | අනාගත | අතීත |
|---|---|---|---|
| ප්‍රථම - | කරයි/කරති | කරන්නේය/කරන්නෝය | කළේය/ කළෝය |
| මධ්‍යම - | කරහි/කරහු | කරන්නෙහි/ කරන්නෙහු | කළෙහි/ කළහු |
| උත්තම - | කරමි/කරමු | කරන්නෙමි/ කරන්නෙමු | කළෙමි/ කළෙමු |
| | ශුද්ධ ක්‍රියා | අශුද්ධ ක්‍රියා (කෘදන්ත ආදි ක්‍රියා) | |

මේ අනුව පැහැදිලි වන කරුණ නම් සිංහල භාෂාවේ ප්‍රයෝජ්‍ය, අසම්භාව්‍ය වැනි විශේෂ අර්ථ ප්‍රකාශ කරන ක්‍රියා පද හැර ක්‍රියා ධාතුවට ක්‍රියා ප්‍රත්‍යය පමණක් එකතු වී සෑදෙන ක්‍රියා ශුද්ධ ක්‍රියා ලෙසත්, ඒවා වර්තමාන කාලය හැඟවීම පිණිස පමණක් යෙදෙන බවත්, කෘදන්ත ක්‍රියා ආදි විශේෂිත අර්ථ ප්‍රකාශ කිරීම සඳහා යෙදෙන ක්‍රියා අශුද්ධ ක්‍රියා යටතට ගැනෙන බවයි. ඒ අනුව සිංහල භාෂාවේ අනතීත කාලය යටතට වැටෙන අනාගත කාල ක්‍රියා පදත්, අතීත කාල ක්‍රියාපදත් සකසා ගැනීමේ දී ශුද්ධ ක්‍රියාවේ කෘදන්ත ස්වරූපයට කාලික ප්‍රත්‍යය එකතු වී සැකසෙන බව හඳුනාගත හැකිය. (කොඩිකාර, 2018) මෙහිලා සඳහන් කළ යුතු අනෙක් කරුණ නම් වර්තමාන කාලයෙහි යෙදෙන ශුද්ධ ක්‍රියාපද ලිංග භේදයක් භජනය නොකරන අතර අනාගත හා අතීත ක්‍රියාවල දී ලිංග භේදය දැක්විය හැකි බවයි. මෙයට හේතුව ලෙස දැක්විය හැක්කේ වර්තමාන කාල ශුද්ධ ක්‍රියා පදයක් අතීත කාලයට හෝ අනාගතයට වරනැගීමෙහි දී ශුද්ධ ධාතු ප්‍රකෘතිය අතීත කෘදන්ත හා වර්තමාන කෘදන්ත පද සකස් වී එම පදවලට පසුව ක්‍රියා ප්‍රත්‍යය එකතු වේ.

| | |
|---|---|
| අතීත කාලයඃ | බැලී + ය = බැලීය/ බැලූ + හ = බැලූහ (ස්වර පූර්වීකරණය) |
| බල ධාතුවඃ | වර්තමාන කාලය - බල + යි = බලයි/ බල + ති = බලති |
| අනාගත කාලයඃ | බල + න්න් + ඒ/ඊ + ය = බලන්නේය/ බලන්නීය |

කුමාරතුංග මුනිදාස මහතා ක්‍රියා විවරණයෙහි ක්‍රියාවක් යන්න දක්වා ඇත්තේ ධාත්වර්ථයක් දෙන පද ක්‍රියාපද වන බවයි. ධාතු විභක්ති සංයෝගයෙන් නිපදින ක්‍රියා ශුද්ධ ක්‍රියා වන බවත් ආඛ්‍යාත යන්න එයට විශේෂ නාමයක් බව දක්වා ඇත. එහිලා ක්‍රියා පදයක අන්තර්ගත වන ව්‍යාකරණ ප්‍රවර්ග කිහිපයක් දක්වා ඇති අතර කාල භේදය යටතේ වර්තමාන, අතීත හා අනාගත වශයෙන් කාල තුනක් දක්වා ඇත. (මුනිදාස, 2022) අනාගත කාල ආඛ්‍යාතය පිළිබඳ තොරතුරු දක්වන එතුමා සිංහලයෙහි අනාගත අර්ථය හඟවන විශේෂ ආඛ්‍යාතයක් නොමැති බවත්, වර්තමාන රූපයම අනාගත අර්ථය දීම සඳහා යෙදෙන බවත්, අනාගත අර්ථය පැවසීමේ දී මතු ආදි පද වර්තමාන ආඛ්‍යාත පද සමඟ යෙදෙන බව දක්වා ඇත. (මුනිදාස, 2022)

මේ පිළිබඳ කෙරුණු පසු කාලීන පර්යේෂණ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී බුත්සරණෙහි ක්‍රියාපද පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහයක් යන මැයෙන් වූ සිය දර්ශනපති උපාධි නිබන්ධනයෙහි ආචාර්ය වින්ධ්‍යා වීරවර්ධන ක්‍රියාපද වරනැගීම අනුව සමාපක හා අසමාපක ක්‍රියා යනුවෙන් ප්‍රභේද දෙකක් යටතේ දක්වා ඇත. ඒ අනුව ත්‍රෛකාලික ක්‍රියා යන්න සමාපක ක්‍රියා යටතේ දක්වා ඇත. විශේෂයෙන් ත්‍රෛකාලික ක්‍රියා යටතේ අතීත හා අනතීත වශයෙන් ප්‍රධාන බෙදීම් දෙකක් දක්වා ඇති අතර අනතීත ක්‍රියා වර්තමාන හා අනාගත වශයෙන් දක්වා ඇත. වර්තමාන වර්නැගීම සම්බන්ධයෙන් උත්තම පුරුෂ ඒකවචන සඳහා -ම්, -මි ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා -මු, -මො, -ම්හ යන ප්‍රත්‍යයත්, මධ්‍යම පුරුෂ ඒකවචන සඳහා -හි, ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා -උ(වු), -ම්හ ප්‍රත්‍යයත්, ප්‍රථම පුරුෂ ඒකවචන සඳහා -යි ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා -ති, -ත්, -හු, -හ, -හැ ප්‍රත්‍යයත් දක්වා ඇත (වීරවර්ධන, 2011).

අතීත වර්නැගීම සාමාන්‍ය අතීතය හා විශේෂ අතීතය වශයෙන් අංශ දෙකක් යටතේ දක්වා තිබේ. සාමාන්‍ය අතීත ශබ්ද වරනැගීමේ දී ක්‍රියා ශබ්දයත් ප්‍රත්‍යයත් අතරට එ, ඒ, අ, ආ, ඔ යන ස්වරවලින් එකක් කාරකවාචී ප්‍රත්‍යයක් වශයෙන් යෙදී ඇති බව දක්වා තිබේ. කෙටි අතීත ශබ්ද සාධනයේ දී ධාත්වන්තය ස්වර පූර්වීකරණයට ලක්වන බව දක්වයි. විශේෂ අතීත රූප සාධනයේ දී හඳුනාගත් විකල්ප කිහිපයක් දක්වා ඇත. මෙහි දී බුත්සරණෙහි අනාගත කාලය සඳහා වෙනම ප්‍රත්‍යය විශේෂයක් නොමැති බවත් ඒ සඳහා වර්තමාන ප්‍රත්‍යයම භාවිත වන බව සඳහන් කොට ඇත. එහිලා සිදත් සඟරාවෙහි

අනාගතය සඳහා දක්වා ඇති ආකාරයම බුත්සරණෙහිද දැකිය හැකි බව දක්වයි (වීරවර්ධන, 2011).

විල්පත ධම්මසේන හිමි විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා අමාවතුරෙහි ක්‍රියාපද පිළිබඳ පදිම විග්‍රහයක් සිදු කොට ඇත. උන්වහන්සේ ක්‍රියා වරනැගීම සම්බන්ධයෙන් වර්තමාන, අතීත හා අනාගත යනුවෙන් කාලත්‍රයක් දක්වා ඇත. අමාවතුරෙහි කිසිම ක්‍රියා ධාතුවක සම්පූර්ණයෙන් වරනැගුණ රූප හමු නොවන බව දක්වා ඇත. අමාවතුරෙහි ද වර්තමානය සඳහා බුත්සරණෙහි මෙන් වරනැගෙන ආකාරයක් මෙහිලා නිරීක්ෂණය විය. අතීත කාලය ද එපරිද්දෙන්ම සිදු වී ඇත. වර්තමානය සඳහා -නු ප්‍රත්‍යය යෝගයෙන් සෑදුණ වර්තමාන කාල කෘදන්ත රූපයෙන් පරව කාරකවාචී ප්‍රත්‍යය යෙදීමෙන් අනාගත ක්‍රියා රූප සෑදෙන බව දක්වා ඇත. තවද, කාරකවාචී ප්‍රත්‍යය යෙදීමේ දී -නු යන්න -න්න් බවට පත්වන බව දක්වා තිබේ (ධම්මසේන හිමි, 1982)

මෙම අධ්‍යයනයෙහි මෙතැන් සිට සීගිරි පද්‍යවල සඳහන් ත්‍රෛකාලික ක්‍රියාපද පිළිබඳ තොරතුරු දක්වනු ලැබේ. ඒ අනුව පූර්වෝක්ත තොරතුරුවලට අනුව ඒවා සීගිරි පද්‍ය භාෂාවෙහි එන ක්‍රියාපද තුළ කෙතෙක් දුරට අන්තර්ගත වී ඇත් ද යන්න මෙහි දී විමසුමට ලක් කෙරේ. සීගිරි පද්‍යයන්හි හමු වන රූපයන් මඟින් සම්පූර්ණ වර නැගුණ රූපයන් සහිත ක්‍රියාවන්ගේ ගණන ඉතා ස්වල්පය. බොහෝ ක්‍රියාවන්හි ඇත්තේ එක් රූපයක් හෝ දෙකක් පමණි. ආත්මනේ පදයෙහි උත්තම, මධ්‍යම පුරුෂ ක්‍රියා රූප යෙදී ඇත්තේ ඉතා කලාතුරකිනි.

## දත්ත විශ්ලේෂණය

### ත්‍රෛකාලික ක්‍රියා - වර්තමාන කාලය

**වේ (වීමෙහි) ධාතුව**

| **පුරුෂ** | **ඒකවචන** | **බහුවචන** |
|---|---|---|
| උත්තම | වෙමි | - |
| මධ්‍යම | වෙහි | වයු |
| ප්‍රථම | වෙයි/වෙය්/වෙයෙ/වෙය | වෙත් |

**ය (යාමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | යමි/යෙමි/යෙමි | යම/යමො/යම්හ/යෙමු/යෙමො/යෙම |
| මධ්‍යම | යහි | - |
| ප්‍රථම | යෙ | යති/යත්/යෙති/යෙත්/යෙත්හ |

**ගන් (ගැනීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | ගනිමි | - |
| මධ්‍යම | - | - |
| ප්‍රථම | ගනියි/ ගන්නි | - |

**බල (බැලීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | - | බලමහ/බලම්හ |
| මධ්‍යම | බලහි | බලයු/බලවු |
| ප්‍රථම | බලයි | බලත් |

**ජන් (දැනීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | ජනිමි/ජනිමි/ජනමි | ජන්මො/ජන්ම/ජනමහ |
| මධ්‍යම | ජන්හි/ජැන්හි | - |
| ප්‍රථම | ජැනෙය් | - |

**කිය (කීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | - | කියමො |
| මධ්‍යම | කියහි | - |
| ප්‍රථම | කිය | කියත්/කියති |

**කර (කිරීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | - | කරමො |
| මධ්‍යම | - | - |
| ප්‍රථම | කෙරෙයි/කෙරෙය්/කෙරෙ | කෙරෙත් |

**කර (කිරීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | - | කරමො |
| මධ්‍යම | - | - |
| ප්‍රථම | කෙරෙයි/කෙරෙය්/කෙරෙ | කෙරෙත් |

## ත්‍රෛකාලික ක්‍රියා - අතීත කාලය

**වෙ (වීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | - | - |
| මධ්‍යම | විහි | වුයුවහ |
| ප්‍රථම | වූයු/වූ/වියි/වී | වු |

**ය (යාමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | ගියෙමි | - |
| මධ්‍යම | ගියෙ | ගියො/ගියහු |
| ප්‍රථම | - | - |

**බල (බැලීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | බැලිමි/බැලීමි | බැලුමො/බැලූමො/බැලීමො |
| මධ්‍යම | බැලී | බැලියො |
| ප්‍රථම | - | - |

**කර (කිරීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | කළෙම්/කළෙමි | කළමො |
| මධ්‍යම | - | - |
| ප්‍රථම | කෙළෙය්/කෙළෙ/කෙළෙයි | කළහු |

**එ (පැමිණීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | අයිමි/ආමි/අමි | - |
| මධ්‍යම | අවහි | - |
| ප්‍රථම | ආයෙ/අයෙ | - |

**කිය (කීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | කීමි | කීමො |
| මධ්‍යම | කිහි | - |
| ප්‍රථම | කී | - |

**ජන් (දැනීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | ජතිමි/ජත්මි/ජතිමි | ජත්මො/ජත්තමො/ජතුමහ/ජත්තමහ/ |
| මධ්‍යම | - | - |
| ප්‍රථම | ජත | ජත්තයුහු |

**ලිය (ලීමෙහි) ධාතුව**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | ලීතිමි/ලීතිම්/ලියිමි/ලීමි/ලිමි | ලීමො |
| මධ්‍යම | - | - |
| ප්‍රථම | ලියි/ලී | ලීවො |

## ත්‍රෛකාලික ප්‍රත්‍යය

ඉහත දත්තවලට අනුව සීගිරි ගීවල ඇතුළත් ක්‍රියාපද මගින් පහත ප්‍රත්‍යය වෙන්කොට හඳුනාගත හැකිය.

**වර්තමාන කාල**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | මි, ම් | ම, මො, ම්හ, මු |
| මධ්‍යම | හි | යු, වු |
| ප්‍රථම | යි, ය්, යෙ, ය, ඒ, නි | ත්, ති, ත්හ |

**අතීත කාල**

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම | මි, ම් | මො, ම්හ |
| මධ්‍යම | හි, ඒ, ඊ | යු, (ව)හ, ඔ, හු |
| ප්‍රථම | යු, උෟ, යි, ඊ, ඒ | උ, හු, (යු)හු, ´ |

## සාකච්ඡාව හා නිගමන

සිදත් සඟරාවේ උත්තම පුරුෂ යන්න දක්වා ඇත්තේ ම ශබ්ද කාරක යනුවෙනි. ඒ සඳහා සීගිරි පද්‍යවලින් උපුටාගන්නා ලද උදාහරණ ක්‍රියාපද කිහිපයක් පහත දැක්වේ.

නොලද් (නොලැබීමෙහි), (පද්‍ය 1)
බැලිමි (බැලීමෙහි) (පද්‍ය 1)
බැලුමො (බැලීමෙහි) (පද්‍ය 17, 20, 36 )
දක්මො (දැකීමෙහි) (පද්‍ය 22)
දුට්මො (දැකීමෙහි) (පද්‍ය 43)
විඳිමි (විඳීමෙහි) (පද්‍ය 4)
ලීමි (ලිවීමෙහි) (පද්‍ය 4, 25)
ජතුමහ (දැනගැනීමෙහි) (පද්‍ය 5)
ගිය, ගියෙ (යෑමෙහි) (පද්‍ය 8, 56)
මි (වීමෙහි) (පද්‍ය 36)

(මුදියන්සේ, 2004)

නොලද් - (නොලද්දෙමි) 'නො' යනු නඤ්ඤාර්ථය හැඟවෙන පදයයි. 'ලද්-' යනු 'ලදි' යන ධාතුවෙහි අවසන් 'ඉ' ස්වරය ලොප් වී තිබේ. 'නොලද්' යන්න උත්තම පුරුෂ අතීත කාල ඒකවචනයෙහි කර්මකාරකයෙහි යෙදී ඇත. මෙම පදය නූතන ව්‍යවහාරයෙහි නොලදිමි/නොලද්දෙමි/නොලබන ලදි නොලබන ලද්දෙමි යනාදි වශයෙන් කර්ම කාරක වාක්‍යවල කර්ම කාරක ක්‍රියාව ලෙස යෙදේ. මෙම ලක්ෂණය ක්‍රි.ව. 8/9 සියවස්වල දී සිංහලයට එක් වූ බව විද්වත් මතයයි. ක්‍රි.ව. 9/10 යන සියවස්වලට අයත් සෙල්ලිපි, පුවරුලිපි ආදියෙහි ද මෙම ලක්ෂණය හඳුනාගත හැකිය. මෙම ව්‍යාකරණ ලක්ෂණය සිංහලයට එකතු වී ඇත්තේ දෙමළ භාෂා ආභාසයෙන් බවද තවත් මතයකි. (කරුණාතිලක, 2006) එහෙත් සීගිරි පද්‍යවල උපකාරක 'ලබ' ධාතුවෙන් සිද්ධ කර්මකාරක ක්‍රියාපද හමුවීම විශේෂත්වයකි.

බැලිමි - (බැලුවෙමි), බැලුමො (බැලුවෙමු)

'බල' යන ක්‍රමික ක්‍රියා ධාතුවෙහි ස්වර පූර්වීකරණය වීමෙන් හා ධාත්වන්තයේ 'ඉ' සහ 'උ' ව්‍යුත්පන්න සර්ග ආදේශ වීමෙන් මෙම ක්‍රියා පදය සැකසී ඇත. ඒකවචනයේ 'ඉ' යන්නත් බහුවචනයේ 'උ' යන්නත් එකතු වී 'බැලි' හා 'බැලු' යන ක්‍රයාරූප සකස් වී තිබේ. ඒවාට පරව උත්තම පුරුෂ ඒකවචන හා බහුවචන ප්‍රත්‍යය එකතු වී බැලිමි/ බැලුමො යන පද යෙදී තිබේ.

බල ධාතුවඃ බැලි (ස්වරපූර්වීකරණය) + මි = බැලිමි
බැලු (ස්වරපූර්වීකරණය) + මො = බැලුමො

ඉහත ක්‍රියාපද ගත් කල්හි දැකීම් අර්ථයෙහි උත්තම පුරුෂ බහුවචන නිරුත්සාහක ක්‍රියාපද දෙකක් වශයෙන් දැක්විය හැකිය.

දක් ධාතුවඃ දක් + මො = දක්මො (දැක්කෙමු)

දුට් ධාතුවඃ දුට් + මො + දුට්මො (දුටුවෙමු)

මෙහි වෙනස නම් බහුවචන ප්‍රත්‍යය ධාතුවට ඍජුවම එකතු වී තිබේ. එහි දී ස්වර පූර්වීකරණය වීමක් දක්නට නොලැබේ. සීගිරි පද්‍යවල වර්තමාන කාලය සඳහා ඒකවචනයේ /මි/, /ම්/ ප්‍රත්‍යයත්, බහුවචනයේ /මහ/, /ම්හ/ යන ප්‍රත්‍යයත් යෙදී තිබේ. විදිමි, දනිම්, ජතුමහ යනාදි ක්‍රියාපදවලින් ඒ බව තහවුරු වේ.

'ගිය', 'ගියෙ' යන ක්‍රියාපද යා ධාතුවෙන් නිපන් අතීත කාල අක්‍රමවත් ක්‍රියාරූප දෙකකි. මෙම ක්‍රියාපද වරනැගීමකින් තොරව නොහොත් ප්‍රත්‍යය රහිතව අතීත කාල උත්තම පුරුෂ ඒකවචන හා බහුවචනයෙහි යෙදී තිබේ. එනම් ප්‍රත්‍යය එකතු කිරීමකින් තොරව අක්‍රමවත් ස්වරූපයම උත්තම පුරුෂයෙහි දක්වා තිබේ. මේවා නූතන සිංහල ලේඛන ව්‍යවහාරයෙහි ගියෙමි/ ගියෙමු යනුවෙන් උත්තම පුරුෂයෙහිත්, ගියෙහි/ ගියෙහු යනුවෙන් මධ්‍යම පුරුෂයෙහිත්, ගියේ ය/ ගියෝ ය යනුවෙන් ප්‍රථම පුරුෂයෙහිත් වරනැඟෙයි.

සීගිරි පද්‍යවල ඇතැම් තැනක /මි/ යන උත්තම පුරුෂ ඒකවචන ප්‍රත්‍යය පමණක් යෙදී තිබේ. එනම් 'ව' ධාතුව වීම් අර්ථයෙහි එන 'වෙමි' යන අදහස දැක්වීම සඳහා මෙම ප්‍රත්‍යය යෙදී ඇත. විශේෂයෙන් වාක්‍යක උක්ත කර්තෘ සඟවා දක්වන අවස්ථාවල දී මෙම ප්‍රත්‍යය සංඥා නාමපද සමග එක්කොට ලියා ඇත.

උදා: සමන්මි/ බුදල්මි

මෙවැනි පද සීගිරි පද්‍යවල අතරින් පතර හමුවේ. නූතන ව්‍යවහාරයට අනුව මෙය දක්වන්නේ නම්, මම සමන් වෙමි. / මම බුදල් වෙමි. යනුයි. එහි උක්ත කර්තෘ හා ක්‍රියාව නොදක්වා සංඥා නාමය සමග /මි/ යන ප්‍රත්‍යය පමණක් දක්වා ලිවීම නූතන ව්‍යවහාරයෙහි ද බහුලව දැකිය හැකි ලක්ෂණයකි.

උදා: මම ගුරුවරයෙක්මි/ මම ශිෂ්‍යයෙක්මි/
මම වැඩිහිටියෙක්මි වශයෙන් යොදනු ලැබේ.

මේ අනුව සීගිරි ගීවල වර්තමාන කාල ක්‍රියාපද හා අතීත කාල ක්‍රියාපද මෙන්ම ඒවා වරනැගීම සඳහා යොදා ගැනෙන ප්‍රත්‍යය හඳුනාගත හැකිය. මෙහි දී උත්තම පුරුෂ ඒකවචන හා බහුවචන ක්‍රියාපද වර්තමාන කාලය සඳහා ශුද්ධ ක්‍රියා මූලයට ප්‍රත්‍යය එකතුවීමෙන් සකස් කොටගෙන තිබේ. ඒ සඳහා /මි/, /ම්/, /ම/, /මො/, /මිහ/, /මු/ යන ප්‍රත්‍යය යොදාගෙන ඇත.

උදා: **ව ධාතුව**

| | | |
|---|---|---|
| ව + මි - (ව් + එ + මි) | = | වෙමි |

**ය (යෑමෙහි) ධාතුව**

| | | |
|---|---|---|
| ය + මි | = | යමි |
| ය + ම් - (ය් + එ + ම්) | = | යෙම් |
| ය + මි - (ය් + එ + මි) | = | යෙමි |
| ය + ම | = | යම |
| ය + මො | = | යමො |
| ය + ම්හ | = | යම්හ |
| ය + මු - (ය් + එ + මු) | = | යෙමු |
| ය + මො - (ය් + එ + මො) | = | යෙමො |
| ය + ම - ( ය් + එ + ම) | = | යෙම |

**ජන් (දැනීමෙහි) ධාතුව**

| | | |
|---|---|---|
| ජන් + ම් - (ජන් + ඉ + ම්) | = | ජනිම් |
| ජන් + මි - (ජන් + ඉ + මි) | = | ජනිමි |
| ජන් + මි - (ජන් + අ + මි) | = | ජනමි |
| ජන් + මො | = | ජන්මො |
| ජන් + ම | = | ජන්ම |
| ජන් + මහ - (ජන් + අ + මහ) | = | ජනමහ |

ඉහත ක්‍රියාපද සාධනය පිළිබඳ සැලකීමේ දී ක්‍රි.ව. 8/9/10 ආදි යුගවල ත්‍රෛකාලික -වර්තමාන කාල උත්තම පුරුෂ ක්‍රියාපද සකස් කරගැනීමේ දී අනුගමනය කොට ඇති ක්‍රමෝපායන් කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

- ශුද්ධ ක්‍රියා ධාතුවට උත්තම පුරුෂ ප්‍රත්‍යය එකතු කර ගැනීම.
- ස්වර පූර්වීකරණය හරහා ශුද්ධ ක්‍රියාවේ ස්වරූපය වෙනස් කර සාධිත ක්‍රියා මූල සකසා ගැනීම.
- ශුද්ධ ක්‍රියාව හා ප්‍රත්‍යය අතරට /ඉ/, /එ/, /අ/ යන ව්‍යුත්පන්න ප්‍රත්‍යය එක් කිරීම.

අවසාන ක්‍රියාවේ ඵලය කර්තෘට අයත් වන අවස්ථාවල ක්‍රියා මූලය හා ප්‍රත්‍යය අතරට /එ/ යන ව්‍යුත්පන්න ප්‍රත්‍යය එක් වෙයි.

වර්තමාන කාල මධ්‍යම පුරුෂය ඒකවචනය සඳහා /හි/ ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /යු/, /වු/ යන ප්‍රත්‍යයත් යෙදී ඇත. ඒ බව පහත උදාහරණ මඟින් පැහැදිලි වේ.

උදා: බලහි, බලයු, බලවු/ වෙහි, වයු

මේවායෙහි ධාතු ප්‍රකෘතියට ඍජුවම ප්‍රත්‍යය එකතු වී තිබේ.

| | | |
|---|---|---|
| බල | + | හි |
| බල | + | යු |
| බල | + | වු |
| වෙ | + | හි |
| ව | + | යු |

මේ අනුව පැහැදිලි වන තවත් කරුණක් නම් සීගිරි පද්‍යවල එන ක්‍රියාපද අතර වර්තමාන කාල ඒකවචන ප්‍රත්‍යය සිදත් සඟරාවට අනුව යෙදෙන අතර බහුවචනය සඳහා වෙනස් ප්‍රත්‍යය කිහිපයක් යෙදෙන බවයි. එනම් සිදත් සඟරාවේ මධ්‍යම පුරුෂ බහුවචනය සඳහා දක්වනුයේ /හු/ යන සර්ගයයි. නමුත් සීගිරි පද්‍යවල සඳහන් ක්‍රියාපද තුළ යෙදී ඇත්තේ /යු/ හා /වු/ යන සර්ග දෙකයි.

වර්තමාන කාල ප්‍රථම පුරුෂ ඒකවචන හා බහුවචන සඳහා ප්‍රත්‍යය කිහිපයක්ම මෙම අවධියේ දී යෙදී තිබූ බව සීගිරි පද්‍ය විමසීමේ දී පැහැදිලි වේ. එනම්, ඒකවචනය සඳහා /යි/, /ය්/, /යෙ/, /ය/, /ඒ/, /නි/ යන ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /ත්/, /ති/, /ත්හ/ යන ප්‍රත්‍යයත් යෙදී තිබේ.

| | | |
|---|---|---|
| වෙ | + | යි |
| වෙ | + | ය් |

යෙ (සාධිත ක්‍රියා ධාතුව/ ය් + එ)

| | | |
|---|---|---|
| වෙ | + | ත් |
| ය | + | ති |
| ය | + | ත් |
| යෙ | + | ත් |
| යෙ | + | ති |
| යෙ | + | ත්හ |

කෙරෙ (සාධිත ක්‍රියා ධාතුව පමණක්ම යෙදීම)

සිදත් සඟරා කතුවරයා වර්තමාන කාල ප්‍රථම පුරුෂ ඒකවචනය සඳහා /ඔ/, /ඒ/, /ඉ/, /ආ/ යන ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /අත්/, /ඉත්/, /එත්/, /ඔත්/ යන ප්‍රත්‍යයත් දක්වා තිබේ. නමුත් සීගිරි පද්‍යය විමසීමේ දී ප්‍රථම පුරුෂ ඒකවචන හා බහුවචන සඳහා /යි/ හා /ති/ යන ප්‍රත්‍යය යෙදීම මෙම අවධියේ සාමාන්‍ය ක්‍රමය බව හඳුනාගත හැකිය. මීට අමතරව /ය්/, /ත්/, /ත්හ/ වැනි ප්‍රත්‍යය ද යෙදී තිබේ. විශේෂයෙන් ශුද්ධ ක්‍රියා ධාතුවෙහි සාධිත ස්වරූපය පමණක්ම වර්තමාන ප්‍රථම පුරුෂ ඒකවචනයෙහි යෙදී ඇත. මෙහි දී ශුද්ධ ක්‍රියාව ස්වර පූර්වීකරණයට ලක්ව තිබේ.

අතීත කාල ක්‍රියා වරනැගෙනුයේ මූල ධාතුවෙන් හෝ ප්‍රයෝජ්‍ය / කර්ම කාරක ක්‍රියා ශබ්දයෙන් හෝ සාධිත අතීත ක්‍රියා ශබ්දයට, පුරුෂ, වචන ප්‍රත්‍යය යෙදීමෙනි. අතීත ක්‍රියා ශබ්ද දෙකකි. එනම්, සාමාන්‍ය අතීත ශබ්දය හා කෙටි අතීත ශබ්දය යනුවෙනි. සාමාන්‍ය අතීත ශබ්ද සකස් වනුයේ අකාරාන්ත ධාතුවල ස්වර පූර්වීකරණය වීමෙනි. එනම්,

උ > ඉ, ඌ > ඊ
ඔ > එ , ඕ > ඒ
අ > ඇ, ආ > ඈ වීමෙනි.

(කරුණාතිලක, 2022)

ක්‍රමික ධාතුවල ස්වර පූර්වීකරණය වීමෙන් හා ධාත්වන්ත ස්වරය -ඊ- , -ඌ- ආදේශ වීමේන් කෙටි අතීත ශබ්ද සෑදේ. එනම් සාධිත අතීත ශබ්දයට පුරුෂ, වචන ප්‍රත්‍යය යෙදීමෙන් කර්තෘකාරක කෙටි අතීත ශබ්ද වරගැගෙයි. (කරුණාතිලක, 2022) සීගිරි පද්‍යවල උත්තම පුරුෂ අතීත කාල ක්‍රියාව සඳහා /මි/, /ම්/, /මො/, /මහ/ යන ප්‍රත්‍යය භාවිත වී ඇති බව ඉහත උදාහරණ විමසීමේ දී හඳුනාගත හැකිය. විශේෂයෙන් සීගිරි පද්‍යවල සඳහන් උත්තම පුරුෂ අතීත ශබ්ද කෙටි අතීතයෙන් යෙදී ඇති අතර ඉහත සඳහන් කරන ලද සියලු ලක්ෂණ ද අන්තර්ගත වේ. ඊට අමතරව ඇතැම් තැනෙක ධාතු අන්තයට -ඉ- ආදේශයක් ද සිදුව ඇත.

උදා:

| ශුද්ධ ධාතුව | සාධිත ධාතුව | ප්‍රත්‍යය එකතුවීම |
|---|---|---|
| බල- (බැලීමෙහි) | බැලි/ බැලී | බැලි + මි = බැලිමි |
| | | බැලී + මි = බැලීමි |
| | | බැලී + ම් = බැලීම් |
| | | බැලි + මො = බැලිමො |
| | | බැලි + ම්හ = බැලිම්හ |
| දන්- (දැනීමෙහි) | දති/ දත් | දති + මි = දතිමි |
| | | දත් + මො = දත්මො |
| කර- (කිරීමෙහි) | කෙළෙ/ කළ | කෙළෙ + මි = කෙළෙමි |
| | | කළ + මො = කළමො |
| එ- (පැමිණීමෙහි) | අයි/ ආ/ අ | අයි + මි = අයිමි |
| | | ආ + මි = ආමි |
| | | අ + මි = අමි |
| ලිය- (ලිවීමෙහි) | ලීති/ලියි/ලී/ලි | ලීති + මි = ලීතිමි |
| | | ලියි + මි = ලියිමි |
| | | ලී + මො = ලීමො |
| | | ලී + මි = ලීමි |
| | | ලි + මි = ලිමි |

සීගිරි පද්‍යවල ඇතැම් ක්‍රියා ධාතුවක සාධිත ක්‍රියා මූලයෙහි අග ඇති ස්වරය ලොප් වී හලන්ත තත්වයට පත්ව අනතුරුව එම අන්ත ව්‍යඤ්ජනය ද්විත්ව වී ඊට පසුව ධාතුව අකාරාන්ත වී ප්‍රත්‍යය එකතු වී තිබේ.

උදා:
ජන් (දැනීමෙහි)
ජත් + මො (ජ + ත්ත් + අ + මො) = ජත්තමො/ජත්තමහ/

මෙම උදාහරණ අනුව පැහැදිලි වන තවත් කරුණක් නම් එකම ශුද්ධ ක්‍රියා ධාතුව අතීත කාලික ප්‍රත්‍යය එකතුවීමේ දී විවිධ සාධිත ස්වරූප හඳුනාගත හැකි වීමයි.

| | | | | |
|---|---|---|---|---|
| | අයි | = | ┌ | අයිමි |
| එ ධාතුව | ආ | = | ┤ | ආමි |
| | අ | = | └ | අමි |
| | ලිති | = | ┌ | ලිතිමි |
| ලිය ධාතුව | ලියි | = | ┤ | ලියිමි |
| | ලී | = | │ | ලීමි |
| | ලි | = | └ | ලිමි |

මේ අනුව හඳුනාගත හැකි තවත් කරුණෙක් නම්, උත්තම පුරුෂ වර්තමාන කාල ඒකවචන /මි/, /මු/ ප්‍රත්‍යයන්ට පූර්වයෙන් -ඉ- කාරය ද (බැලිමි) බහු වචනයෙහි /මු/, /මො/, /මිහ/, /මිහු/ යන ප්‍රත්‍යයන්ට පූර්වයෙන් -උ- කාරය ද (බැලුමු) වේ. යන සිදත් සඟරාව දැක්වූ අතීත වර්තමාන භේදය විවාදාපන්න බවයි. සීගිරි පද්‍යයන්හි පෙනෙන නියම උදාහරණයන්ගෙන් එය සනාථ කළ නොහැකිය.

සීගිරි පද්‍යවල ක්‍රියාපද විමසීමේ දී අතීත කාල මධ්‍යම පුරුෂ ඒකවචනය සඳහා /හි/, /එ/, /ඊ/, යන ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /යු + (වහ), /ඔ/, /හු/, /යො/ යන ප්‍රත්‍යයත් යෙදී තිබේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා: | වි | + | හි | = | විහි (වෙ ධාතුව) |
| | ගිය | + | එ | = | ගියෙ (ය ධාතුව) |
| | ගිය | + | ඔ | = | ගියො (ය ධාතුව) |
| | ගිය | + | හු | = | ගියහු (ය ධාතුව) |
| | බල | + | ඊ | = | බැලී (බල ධාතුව) |

නූතන සිංහල ව්‍යවහාරයෙහි අතීත කාල මධ්‍යම පුරුෂ සඳහා /හි/ සහ /හු/ යන ප්‍රත්‍යය යෙදේ. එය සිදත් සඟරාවේ ද දක්වා තිබීමෙන් පැහැදිලිය. එහි දී ඉහත දක්වන ආකාරයට ශුද්ධ ධාතුවෙහි ස්වරූපය වෙනස් වී එම සාධිත ධාතුවට කාලික ප්‍රත්‍යය එකතු වේ. මේ ලක්ෂණය සීගිරි පද්‍යවල සඳහන් ක්‍රියාපද තුළද දැකිය හැකි ලක්ෂණයකි. නමුත් මෙම අවධියේ දී අතීත කාල මධ්‍යම පුරුෂ ඒකවචන හා බහුවචන සඳහා /එ/, /ඔ/, /ඊ/, /යු/ වැනි ප්‍රත්‍යය යෙදී තිබේ.

අතීත කාල ප්‍රථම පුරුෂය සඳහා සිදත් සඟරා කතුවරයා දක්වා ඇත්තේ /උඃ/, /ඔ/, /උ/, /උන්/ යන ප්‍රත්‍යයයි. සීගිරි පද්‍යවල

අන්තර්ගත මෙම කාලයට අයත් ප්‍රථම පුරුෂ ඒකවචනය සඳහා /යු/, /උං/, /යි/, /ඊ/, /ඒ/ ප්‍රත්‍යය ද, බහුවචනය සඳහා /උ/, /හු/, /යු(හු)/, /ˊ/ ප්‍රත්‍යය ද යෙදේ. විශේෂයෙන් මෙහි දී ප්‍රථම පුරුෂ ඒකවචනයෙහි එකම ශුද්ධ ක්‍රියා ධාතුවක ස්වර පූර්වීකරණයෙන් සාධිත ක්‍රියා ධාතු කිහිපයක් සකස් වී තිබේ.

උදා:

| | | |
|---|---|---|
| වෙ (වීමෙහි) ධාතුව | - | වුයු, වූ, වියි, වී |
| කර (කිරීමෙහි) ධාතුව | - | කෙළෙය්, කෙළෙ, කෙළෙයි |
| එ (පැමිණීමෙහි) ධාතුව | - | ආයෙ, අයෙ |
| ගන් (ගැනීමෙහි) ධාතුව | - | ගති, ගත, ගත් |
| ලිය (ලිවීමෙහි) ධාතුව | - | ලියි, ලී |

යනාදි වශයෙන් හඳුනාගත හැකිය. මේවා ස්වර පූර්වීකරණයෙන් එකම ධාතුව විවිධ ස්වරූපවලින් සකසාගෙන තිබේ.

වර්තමාන කාල වරනැගීම මෙන් අනාගත කාල වරනැගීම ශුද්ධ ආඛ්‍යාතයක් නොවෙයි. එනම් ක්‍රියාපදවල කෘදන්ත ස්වරූපයට කාලික ප්‍රත්‍යය එකතු වේ. අනාගත ක්‍රියා ශබ්දය සෑදෙනුයේ මූල ධාතුවට -න්-, -න්න්- ප්‍රත්‍යයන් යෙදීමෙන් අනාගත කාල ක්‍රියා පද සකසා ගැනීම සාමාන්‍ය ස්වරූපයයි. පුරුෂ/ නපුංසක ලිංග ඒකවචනයෙහි /ඒ/ ප්‍රත්‍යයද ස්ත්‍රී ලිංග ඒකවචනයෙහි /ඊ/ ප්‍රත්‍යයද උත්තම පුරුෂ බහුවචනයෙහි /ඒ/,/අ/ ප්‍රත්‍යයද මධ්‍යම පුරුෂ බහුවචනයෙහි /අ/ ප්‍රත්‍යයද ප්‍රථම පුරුෂ බහුවචනයෙහි /ඕ/, /ආ/ ප්‍රත්‍යයද යෙදීමෙනි. මේ අනුව පැහැදිලි වනුයේ අනාගත කාලය සඳහා කේවල -න්- හා ද්විත්ව -න්න්- යෙදීමෙන් වර්තමාන කෘදන්ත පද සකස් කොට ඒවාට කාලික ප්‍රත්‍යය එකතුකොට අනාගත කාල ක්‍රියාපද සකස් කොටගෙන තිබේ. සීගිරි පද්‍යවල මෙමඅනාගතවාචී ක්‍රියාපද හමුවේ.

ළ තද් වත තා එ පසොමි මොළොකක් විය පහන්නෙමි (සීගිරි ගී - 304)

පවෙහි ආ කෙනෙක් මතු මෙ ජනනෙ (සීගිරි ගී - 527)

මන ම තම හට් මෙ ගත් දිගැස්නි කුම් කොට් සහන්නෙමි (සීගිරි ගී - 123)

සඟ වන් බෙයන්ද් ආ කල වන්නෙමි බලය් සිතතොස් (සීගිරි ගී - 536)

නොවි සිහි යන්නමහ මහවන් හෙළිල්ලබියැන් (සීගිරි ගී - 180)

වජනක් නැත්තෙය් අපට ඇවිද් යන්නමො අසදින් (සීගිරි ගී - 647)

පිය පහස මෙ දිගැස සන්දෙහි ලත් වෙමි සුවපත් (සීගිරි ගී - 536) (මුදියන්සේ, 2004)

මෙම සීගිරි පාඨවල සඳහන් අනාගත කාල යැයි සිතෙන ක්‍රියාපද පහත පරිදි දැක්විය හැකිය. එනම්,

පහන්නෙමි
ජනනෙ
සහන්නෙමි
වන්නෙමි
යන්නමහ
යන්නමො
ලත් වෙමි

මේවා කේවලව සැලකූ විට අනාගත කාල ක්‍රියාපද යැයි සැලකීම යුක්ති යුක්ත වේ. නමුත් මෙහි සඳහන් කළ යුතු වැදගත් කරුණ නම් මෙම පද වාක්‍ය හා සම්බන්ධ වී තිබිය දී ඉන් ගම්‍ය වන සමස්ත අර්ථය සැලකූ කල ඇතැම් පද මගින් අනාගතවාචී අදහසක් නොපැවසේ. ඒවා වර්තමාන අර්ථයෙන්ම යෙදී තිබේ.

ඉහත සඳහන් ක්‍රියාපද අතරින් **පහන්නෙමි, ජනනෙ, සහන්නෙමි, ලත්වෙමි** යනාදි ක්‍රියාපද මඟින් අනාගතවාචී අර්ථයක් ප්‍රකාශ වෙන අතර **වන්නෙමි, යන්නමහ, යන්නමො** යන ක්‍රියාපද රූපීය වශයෙන් අනාගත කාල ක්‍රියාපද වශයෙන් දැක්විය හැකි වුවද ඇතැම් පද මඟින් අනාගත කාලික අර්ථයක් ප්‍රකාශ නොවේ. නිදසුනක් වශයෙන් **ළ තඳ් වත තා එ පසොමි මොළොකක් විය පහන්නෙමි** යන සීගිරි පද්‍ය පාදයෙහි අදහස වනුයේ ඔබ වෙත යම්කිසි මොලොක් බවක් ඇති වුවහොත් මම පැහැදෙමි යන්නයි. මෙහි සඳහන් **පහන්නෙමි** යන පදය අනාගත කාල අර්ථයෙන් යෙදී ඇත යන්නට හේතුව වනුයේ මොළොක් බව ඇති වුවහොත් යනුවෙන් අනියමාර්ථ අසම්භාව්‍ය

ක්‍රියා පදයක් යෙදී තිබීමයි. එනම් ඇය කෙරෙහි මොළොක් බවක් තවමත් ඇති නොවූ බැවිනි. එහෙයින් මෙහි දී කවියාගේ පැහැදීම සිදු වන්නේ සීගිරි අප්සරාවන්ගේ මොළොක් බව ඇති වූ පසුවය. ඒ අදහසින් මෙම **පහන්නෙමි** යන පදය අනාගත කාල ක්‍රියා පදයක් ලෙස දැක්විය හැකිය. නමුත් මෙහි සඳහන් ඇතැම් ක්‍රියාපද මඟින් ස්ඵුට වන අදහස දෙස අවධානය යොමු කිරීමේ දී ඒවා වර්තමාන අදහසින්ම යෙදී තිබේ.

අනාගත කාලය සකස් කරගැනීමේ දී මෙහි හමුවන විශේෂ ලක්ෂණයක් නම් වර්තමාන කාල ක්‍රියාපද සමඟ අනාගත කාල වාචී උපපද භාවිත කොට තිබීමයි. ඒ බව **පවෙහි ආ කෙනෙක් මතු මෙ ජනනෙ** යන පාදයෙහි මතු යන අනාගත කාල වාචී උපපදය යොදා තිබීමෙන් **ජනනෙ** යන වර්තමාන කාල ක්‍රියාව අනාගත කාල අර්ථයෙන් යොදා තිබේ.

මේ අනුව සීගිරි පද්‍යවල අනාගත කාල ක්‍රියා රූප ආකාරයෙන් බහුතරයක් පද යෙදී තිබුණ ද එමගින් වර්තමාන අදහසක් ඉදිරිපත් වන අවස්ථා බහුලය. එමෙන්ම වර්තමාන කාල ක්‍රියා පද අනාගත වාචී උපපද යෙදීමකින් තොරව ද අනාගත කාල අර්ථයෙන් යෙදී ඇත. නමුත් එය රූපීය වශයෙන් වර්තමාන කාලයට අයත් වේ.

මේ අනුව පැහැදිලි වන කරුණ නම් පැරණි සිංහල භාෂාවෙහි අනාගත කාලය සඳහා වර්තමාන කාල ක්‍රියා පදය ද භාවිත කොට තිබේය යන්නයි. මෙහි දී පැරණි මූලාශ්‍රයන් කිහිපයක් විමසා බැලීම වැදගත් වේ. **බෙහෙදක් කෙරෙම් ද? යි විචාළෝ ය.....නැති කරවා ලූවොත් සෙසු කුමක් ද? දරුමලු පුඬුවෙන් මම නුඹට මිඬි වෙමි.** (ජයතිලක, 1964) මෙහි අදහස දෙස අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වනුයේ මිඬි වෙමි යන්න අනාගත කාල අර්ථයෙන් යෙදී ඇත. නමුත් මෙහි යෙදී ඇත්තේ වර්තමාන කාල ක්‍රියා පදයකි. කාව්‍යසේඛරයෙහි 10වෙනි සර්ගයෙහි 105වන පද්‍යයෙහි **මග රුඳුන අද තො නසි, ගෙට ගිය අඹුව නසි** (ඥාණවිමල හිමි, 1960). මෙය අනාගතාර්ථ වාක්‍ය ප්‍රකාශයකි. නමුත් මෙහි ක්‍රියා රූප වර්තමාන කාලයට අයත් ය. ගුත්තිලකාව්‍යයෙහි 193 පද්‍යයෙහි **සිල්ප සත්වෙනි දවස දක්වමි** (තිලකසිරි, 2017) යන පද්‍ය පාඨය මඟින් ද ප්‍රකාශ වනුයේ අනාගත කාල අදහසකි. මෙහි ද දක්වමි යනු වර්තමාන කාල ක්‍රියා රූපයකි. නමුත් අනාගත අර්ථයෙන් යෙදී ඇත.

මෙම පැරණි සම්භාව්‍ය ගද්‍ය පද්‍ය කෘතිවල සඳහන් වර්තමාන හා අනාගත යැයි සැලකෙන ක්‍රියා පද වර්තමාන හා අනාගත යන කාල දෙකෙහිම යෙදී ඇත. අනෙක් අතට නූතන සිංහල ව්‍යාකරණයෙහි හා සිදත් සඟරාවෙහි අනාගත කාලය පිළිබඳ සඳහන් වුවද පැරණි පතපොතෙහි මෙම රූප දෙකම කාල දෙකෙහිම යෙදී ඇති අයුරු හඳුනාගත හැකිය.

සීගිරි පද්‍යවල මේ ලක්ෂණය බහුලව දැකිය හැකිය. ඩබ්.එස් කරුණාතිලක මහතා සිංහල භාෂා ව්‍යාකරණය යන කෘතියෙහි කාල භේදය දක්වා ඇත්තේ අතීත හා අනතීත වශයෙනි. වාග්විද්‍යාත්මකව විමසා බැලීමේ දී ද පැහැදිලි වනුයේ භාෂණ සිංහලයෙහි ඇත්තේ අතීත හා අනතීත භේදය බවයි.

සීගිරි පද්‍යවල අනාගතාර්ථය ප්‍රකට කරන විශේෂ ක්‍රියාරූප කිහිපයක් ද හමුවේ. එනම් පහත සීගිරි පද්‍ය පාඨ සලකා බලමු.

අවුද් බැලුයොත් තා කියවි ගුණ එනරවරා (පද්‍යය - 75)

ලද වි සිහි එවි හෙ එවි ලයු මෙතෙක් කල් වත් (පද්‍යය - 465)

මෙ ලිය පියෙ එයුන් මෙ තමන් දිවි යවි යි පවසා (පද්‍යය - 543)

මෙම පද්‍යවල සඳහන් කියවි, එවි, යවි යන පද මඟින් අනාගතාර්ථයක් ප්‍රකාශ වේ. එනම්,

| | | |
|---|---|---|
| කිය | + | වි |
| එ | + | වි |
| ය | + | වි |

අනාගතයෙහි සිදුවිය යුතු යම්කිසි කාර්යයක් සඳහන් කළ යුතු අවස්ථාවන්හි දී නූතන කථා ව්‍යවහාරයෙහිද -වි- ප්‍රත්‍යයෙන් අන්ත ක්‍රියාරූප නිරතුරුව භාවිත කෙරෙයි. උදාහරණ වශයෙන් යාවි, කාවි, පැමිණේවි, බලාවි, සිනාසේවි වැනි පද දැක්විය හැකිය. එක් පැත්තකින් මෙම කියවි, එවි , යවි ආදි පද අනාගත කාල අර්ථයක් ප්‍රකට කරනවා මෙන්ම සීගිරි පද්‍ය තුළ එකල ව්‍යවහාර සිංහල බස් වහර යෙදී ඇත යන්න කදිම නිදසුනක් වශයෙන් ද දැක්විය හැකිය. මන්ද යත් මෙම වි ප්‍රත්‍යාන්ත ක්‍රියාපද නූතන ව්‍යවහාරයෙහි අනාගත අදහසක් දීම සඳහා නිතර භාවිත වනු දැකිය හැකිය. ඒ සඳහා වර්තමාන සිංහල බස් වහරේ එන පහත නිදසුන් හා සැසඳෙන අයුරු ůමසා බැලිය හැකිය.

එයා ගෙදර යාවි.
රජය විභාගය කල් දමාවි.
පාසල් නිවාඩු වාරය තව දික් කරාවි
මල්ලි හෙට ගෙදර ඒවි.

මෙම වි ප්‍රත්‍යාන්ත ක්‍රියාපද අනාගත කාල අනියමාර්ථ අර්ථයෙන් වත්මන් ව්‍යවහාර සිංහලයෙහි භාවිත වේ. එසේම අසම්භාව්‍ය ක්‍රියාපද සහිත වාක්‍යවල මෙම ප්‍රත්‍යාන්ත ක්‍රියාපද සිංහල බස් වහරෙහි යෙදේ. තවද, මෙම ප්‍රත්‍යාන්ත ක්‍රියාපද වාක්‍ය සමඟ යෝග්‍ය වීමේ දී හෙට, අනිද්දා වැනි අනාගත වාචී උපපද යෙදීම ද දැකිය හැකිය. මෙම ලක්ෂණ සීගිරි පද්‍යවලින් ද හඳුනාගත හැකි වීම ද විශේෂත්වයක් වශයෙන් දැක්විය හැකිය.

## සමාලෝචනය

ඉහත සඳහන් විමසීමට අනුව පැහැදිලි වනුයේ සීගිරි පද්‍යවල සඳහන් ක්‍රියාපදවල සංස්ථිතියෙහි විවිධතා හඳුනාගත හැකි බවයි. මතු සඳහන් කළ ආකාරයට සිදත් සඟරාවේ අතීත, වර්තමාන හා අනාගත යන ත්‍රෛකාලයටම අදාළව පුරුෂත්‍රයෙහි ප්‍රත්‍යය දක්වා තිබේ. නමුත් සීගිරි පද්‍ය විමර්ශනය කිරීමේ දී බහුලව යෙදී ඇත්තෙ අතීත හා වර්තමාන කාල ක්‍රියාපද භාවිත වන අතර අනාගත කාලය දැක්වීමේ දී බහුලව වර්තමාන කාල ක්‍රියාපද යෙදුනු අවස්ථා හඳුනාගත හැකිය. සීගිරි පද්‍ය තුළ අනාගත කාලික රූපය ගැන් වූ ක්‍රියාපද හඳුනාගත හැකි අතර ඇතැම් අවස්ථාවල එම අනාගත රූපය ගැන් වූ ක්‍රියාපද වර්තමාන කාල අර්ථයෙන් ද යෙදී ඇත. එමෙන්ම සිදත් සඟරාවේ සඳහන් ප්‍රත්‍යයවලට අමතරව සීගිරි පද්‍ය පිළිබඳ විමසීමේ දී ක්‍රි.ව. 8/9/10 ආදි යුගවල සිංහල භාෂාවේ ක්‍රියාපද සම්බන්ධව කාලත්‍රයේ යෙදුනු වෙනස් ප්‍රත්‍යය රාශියක් හඳුනාගත හැකි වේ. එවා ඉහත විමර්ශනයෙහි දක්වා තිබේ.

නිදසුනක් ලෙස වර්තමාන සිංහල ව්‍යවහාරයෙහි ද මධ්‍යම පුරුෂ ඒකවචන හා බහුවචන සඳහා කාලත්‍රයේ භාවිත වනුයේ හි සහ හු යන ප්‍රත්‍යය දෙකය. එහෙත් පූර්වෝක්ත සියවස්වල දී අතීත කාල මධ්‍යම පුරුෂ ඒකවචන සඳහා /හි/, /ඒ/, /ඊ/ ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /යු/, /හු/, /වහ/, /ඔ/, යනු ප්‍රත්‍යයත්, වර්තමාන කාල මධ්‍යම

පුරුෂ ඒකවචනය සඳහා /හි/ ප්‍රත්‍යයත්, බහුවචනය සඳහා /යු/, /වු/ ප්‍රත්‍යයත් භාවිත වී තිබේ.

විශේෂයෙන් සාමාන්‍ය වත්මන් සිංහල ව්‍යවහාරයෙහි මෙන්ම මෙම අවධිවල දී සිංහල භාෂාවේ වර්තමාන කාලික ක්‍රියාපද සකස් කරගැනීමේ දී ධාතු ප්‍රකෘතිය වෙනස් වීමකින් තොරව අවසන් ප්‍රත්‍යය එකතු වී තිබේ. ඇතැම් හල් අන්ත ධාතු ප්‍රකෘතිවලට ප්‍රත්‍යය එකතු වීමේ දී අන්ත හලන්ත ශබ්දය ද්විත්ව වී තිබේ. (ගන් + ඉ = ගන් + න් + ඉ = ගන්නි) නමුත් අතීත කාල ක්‍රියාපද සකස් කරගැනීමේ දී ධාතු ප්‍රකෘතියේ පළමු වර්ණයේ ස්වර පූර්වීකරණයට ලක්ව තිබේ. සීගිරි පද්‍යවල අනාගත කාල ක්‍රියාපද යෙදී තිබුන ද ඇතැම් අවස්ථාවල දී ඒවා වර්තමාන කාලික අර්ථයෙන් ම යෙදී තිබේ. ඇතැම් වර්තමාන කාල ක්‍රියාපද මුලට අනාගත කාල වාචී නිපාත යෙදීමෙන් අනාගත කාල අර්ථ සකස් කොටගෙන තිබේ. මේ අනුව පැහැදිලි වනුයේ මෙම අවධියෙහි සිංහල භාෂාවෙහි අනාගත කාලය දැක්වීම සඳහා වර්තමාන කාල ක්‍රියා පද සහ අනාගත කාලික ස්වරූපය ගැන්වූ ක්‍රියාපද යන කොටස් දෙකම යෙදී ඇති බවයි.

අනෙක් කරුණ නම් මෙම සීගිරි පද්‍ය ලියූවෝ අතර උගත්, නූගත් යන දෙපිරිසම සිට ඇත. එහි දී සාමාන්‍ය ජනයා විසින් ලියන ලද පද්‍යවල භාෂා ලක්ෂණ සැලකූ විට භාෂණ ව්‍යවහාරයට බර සාමාන්‍ය ස්වරූපයක් ද උගත් යැයි සැලකෙන පුද්ගලයන් ලියන ලද පද්‍යවල ලේඛනයට බර විදග්ධ ස්වරූපයක් ද හඳුනාගත හැකිය. ඒ අනුව මෙම පද්‍ය තුළ එවකට කථා ව්‍යවහාරයෙහි පැවති භාෂා ව්‍යවහාරය ද යෙදී ඇත යන්න ද අනුමාන කළ හැකිය.

මේ අනුව මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වනුයේ සීගිරි පද්‍යවල සඳහන් ක්‍රියාපද මඟින් සිංහල භාෂාවේ මධ්‍යතන අවධියට අයත් ක්‍රියාපදවල සංස්ථිතියෙහි විවිධතා පවතින අතර ඒවා ඉහත ආකාරයෙන් හඳුනාගත හැකි බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරුණාතිලක, ඩබ්. එස්. (2006). *භාෂා සමීක්ෂා.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාතිලක, ඩබ්. එස්. (2022) *සිංහල භාෂා ව්‍යාකරණය.* සීමාසහිත ඇම් ඩී ගුණසේන සහ සමාගම.

කොඩිකාර, ආර්. (2018). *සිංහල භාෂාව හා ව්‍යාකරණය.* සරසවි ප්‍රකාශකයෝ.

ගම්ලත්, එස්. (2000). *සීගිර කුරුටු ගී.* 1 වෙළුම. පුරාවිද්‍යා දෙපාරතමේන්තුව.

ජයතිලක, ඩී.බී. (1964). *සද්ධර්මරත්නාවලිය.* සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ඤාණවිමල හිමි, කේ. (1960) කාව්‍යශේඛරය. සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

තිලකසිරි, එස්. (2017). *ගුත්තිල කාව්‍ය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මරතන හිමි, î. (2014). *බාලාවතාර දීපනි.* සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ.

පේමානන්ද හිමි, පී. (2004). *සිංහල භාෂාවේ පරිණාමය හා සිදත් සඟරාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මුදියන්සේ, එන්. (2004). *සීගිරි පද්‍යාවලිය.* දෙවන මුද්‍රණය. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමාලෝකතිස්ස හිමි, කේ. (2014). *සිදත් සඟරා වියරණ විමසුම.* සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Gunasekara, A.M. (2008). *Comprehensive Grammar of the Sinhalese Language*. S. Godage & Brothers (Pvt) Ltd.

Karunatillake, W.S. (2012). *Etymological lexicon of the Sinhala language*. S. Godage & Brothers (Pvt) Ltd.

Paranavitana, Senarat. (1956). *Sigiri Graffiti: Being Sinhalese Verses of the Eighth, Ninth, and Tenth Centuries*. Vol I. London: Oxford University Press for the Archaeological Survey of Ceylon

Paranavitana, Senarat. (1956). *Sigiri Graffiti: Being Sinhalese Verses of the Eighth, Ninth, and Tenth Centuries*. Vol II. London: Oxford University Press for the Archaeological Surv